11 ශ්‍රේණිය

ඉතිහාසය

# කියවීම් පත්‍රිකාව

3.1 ඒකකය

## ආගමික හා සංස්කෘතික පුනරුදයේ පසුබිම







# ශ්‍රී ලංකාවේ ජාතික පුනරුදය

# ක්‍රිස්තියානි ආගම පැතිරවීම සඳහා ලංකාවට පැමිණි මිෂනාරි කණ්ඩායම් ඔවුන්ගේ ආගම් ප්‍රචාරණය සඳහා විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- ලේඛන මාධ්‍ය යොදා ගැනීම

මූල්‍යමය ශක්තිය තිබූ මිෂනාරි සංවිධාන මුද්‍රණාල පිහිටුවීමට මෙන්ම පොත්පත්, සඟරා ආදිය මුද්‍රණය කරවීමට කටයුතු කරන ලදී . බයිබලය සිංහලයට පරිවර්තනය කිරීමත් ක්‍රිස්තියානි ආගම සම්බන්ධ සඟරා පුවත්පත්, පොත්පත් මුද්‍රණය කිරීමටත් බෙදා හැරීමටත් කටයුතු කරන ලදී .

උදා : චර්ච් මිෂනාරි සංවිධානය - මාසික තෑග්ග
ආගමික පුස්තිකා සංගමය - ලංකා නිධානය
බැප්ටිස්ට් සමාගම - උරගල

- දේශන මාධ්‍ය යොදා ගැනීම

මිෂනාරි පූජකවරුන් පන්සල් හා මහජනතාව ගැවසෙන වෙනත් ස්ථානවල දේශන පවත්වා තමා ආගමික ප්‍රචාර වල නිරත විය. ලංකාවේ පැවති ආගම් වල ඇතැම් සිරිත් විරිත් විවේචනයට ලක් කරන ලදී .

- අධ්‍යාපනය

මිෂනාරීන් පාසල් ආරම්භ කිරීමටත් , පවත්වාගෙන යාමටත් කැපවීමෙන් ක්‍රියා කරන ලදී. එම පාසල්වල ආගම් ප්‍රචාරයට මුල් තැනක් හිමිවිය. මිෂනාරි අධ්‍යාපන කටයුතු වලට රජයේ අනුග්‍රහය ලැබුණි . බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී රජයේ තනතුරු ලබා ගැනීමට ඉංග්‍රීසි භාෂා දැනුම අවශ්‍ය විය. මේ නිසා සිංහල , දෙමළ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීම සඳහා මිෂනාරි පාසල් වලට යාමට සිදුවිය.

19 වන සියවස අවසානය වන විට බෞද්ධ පුනරුද ව්‍යාපාරය කටයුතු මිෂනාරීන් ගේ කටයුතු වලට ප්‍රති උත්තර දීමෙන් ඔබ්බට ව්‍යාප්ත වී තවත් ව්‍යාපාර තුනක් බිහි විය .

1. දේශානුරාගය හා ජාත්‍යාලය වර්ධනය කිරීමේ ව්‍යාපාරය

බ්‍රිතාන්‍ය පාලන සමයේ රට තුළ බටහිර සංස්කෘතියේ වේගයෙන් ව්‍යාප්ත වීම නිසා බටහිර සිරිත් විරිත් අනුකරණය පැතිර ගිය අතර ඒ වෙනුවට දේශීය සංස්කෘතිය අගය කිරීමට ජනතාව උනන්දු කරවීමෙන් රටට ආදරේ කරන ජනතාවක් බිහි කිරීම මෙම ව්‍යාපාරයේ අරමුණු විය . ඒ සඳහා විවිධ ක්‍රම උපක්‍රම මගින් දායක වූ පුද්ගලයන් කිහිප දෙනෙකි.

*අනගාරික ධර්මපාල තුමා - ප්‍රසිද්ධ දේශන පවත්වමින්ද , සිංහල බෞද්ධයා හා මහා බෝධි සඟරාව වැනි ප්‍රකාශනවලට ලිපි සැපයීම මගින්

*පියදාස සිරිසේන - සිංහල ජාතිය වැනි පුවත්පත් නවකතා ආදියෙන් විචාරයකින් තොරව බටහිර සංස්කෘතිය වැලඳගැනීම විවේචනය කිරීම.

2. බෞද්ධ පූජනීය ස්ථාන රැක ගැනීමේ කටයුතු

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු අනුරාධපුර පොළොන්නරුව වැනි පැරණි අගනුවරවල් ආශ්‍රිත බෞද්ධ ස්මාරක වල්බිහි වී විනාශ වෙමින් පැවති අතර 19 වෙන සියවස අග භාගය වන විට ඒවා ප්‍රතිසංස්කරණය කොට අතීත උරුමයන් රැකගැනීම ගැන ජනතාව තුළ උනන්දුවක් ඇති විය . පුරාවිද්‍යා ගවේෂණ , කැණීම් හා පර්යේෂණ මගින් පැරණි සංස්කෘතියේ අංග මතු මතුකිරීමට යුරෝපීය උගතුන් වන ජෝර්ජ් ටර්නර්, රීස් ඩේවිඩ් , එච්. සී.පී .බෙල් , හෙන්ද්‍රි භකර් ආදීන් ක්‍රියා කරන ලදී. ඔවුන් ලියූ පොත පතට පරිවාර වශයෙන් දේශීය උගතුන් ද පොතපත ලිවීම නිසා පැරණි ශිෂ්ටාචරයන් පිළිබඳ පොදුජන අවබෝධය ද පුළුල් විය. මෙම පරිසරය තුළ වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා බොහෝ කැපකිරීම් කරමින් අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කර කරගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී . අනගාරික ධර්මපාල තුමා ඉන්දියාවේ පූජනීය ස්ථාන රැක ගැනීමට ඉදිරිපත් විය .

3.අමද්‍යප ව්‍යාපාරය

බ්‍රිතාන්‍ය පාලන සමයේ දිවයිනේ මධ්‍යසාර භාවිතය පැතිර යාම නිසා ගැටලු රැසක් නිර්මාණය වෙමින් පැවතින. මෙම නිසා මද්‍යසාර භාවිතයට එරෙහිව ජනතාව දැනුවත් කිරීමට ලාංකික ගිහි පැවිදි උගතුන් කිහිප දෙනකු ක්‍රියා කරන ලදී . භික්ෂූන් වහන්සේලා මෙහි දී කැපවීමෙන් සේවය කළ අතර පහත සඳහන් ගිහි උගතුන් ද විවිධ ක්‍රියා අනුගමනය කරන ලදී.

*අනගාරික ධර්මපාල තුමා - ප්‍රසිද්ධ දේශන හා පුවත්පත් මාර්ගයෙන් ජනතාව දැනුවත් කිරීම.

*පියදාස සිරිසේන මහතා - නවකතා වල විවිධ චරිත සංවාදයට ලක් කොට මධ්‍යසාර මද්‍යසාර භාවිතයේ අනිසි විපාක පැහැදිලි කිරීම.

*ජෝන් ද සිල්වා මහතා - නාට්‍ය මගින්

උදා : පරාභව නාට්‍යයේ සුරා කාණ්ඩය තුළින් මත්පැන් භාවිතයේ අයහපත පෙන්වීම .